## ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). අයහාර වියදම් රු.273,818 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුළදී රු.63,362 කට මිලදී ගත් පරිභෝගික ද්‍රව්‍ය ප්‍රාග්ධනීත කර ඊට අදාලව රු.5,280 ක ක්ෂය ප්‍රතිපාදනද ගිණුම්ගත කර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගත් එකතුව රු.71,348 ක් වූ විෂයයන් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

#### 1.2.2 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ ඉකුත් වර්ෂයේදී ශුද්ධ වත්කම් වල අගය රු.12,174,553 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.2,819,132 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන විට ශුද්ධ වත්කම් වල අගය රු 9,355,421 කින් අඩු වී ඇති බැවින් එය ආයතනයේ පැවත්මට අහිතකර ලෙස බලපෑ හැකි බවත් නිරීක්ෂණය විය.

#### 1.2.3 නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ 231(1) | හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරි වැරදි බැලීමට හැකිවනු පිණිස සෑම සේවයක් පිළිබඳවම සම්පර්ණ විස්තර සියළුම වවුචරවල සඳහන් කර නොතිබුණු අවස්ථාවන් නියැදි පරීක්ෂාවන්වලදී අනාවරණය විය. |

| | |
|---|---|
| (ii) මු.රෙ 264 | වවුචරයේ සඳහන් දළ මුදල ලද බවට අදායකයාගෙන් ලබාගත් කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත්, අවස්ථා 11 කදී රු.1,314,590 ක් වටිනා ගෙවීම් සම්බන්ධයෙන් කුවිතානස ලබාගෙන නොතිබුණි. |
| (iii) මු.රෙ 395 (ඌ) | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරම, චෙක්පත් ලිවීම, මුදල් පොත පවත්වාගැනීම යන කාර්යයන්ට එකම නිලධාරිණියක විසින් සිදුකර තිබුණි. |

(ආ). චක්‍රලේඛ

| | |
|---|---|
| (i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය | අගලවත්ත කාර්යාලයේ ආපන ශාලාව ඉදිකිරම සම්බන්ධයෙන් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබූ අතර වටිනාකම රු.250,000 ඉක්මවන වැඩ සඳහා වූ කොන්ත්‍රාත සඳහා විධිමත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද, මේ සඳහා ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. |
| (ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.6 මාර්ගෝපදේශය | කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීමේ කාලසීමාව අවසන් වන තුරු නිශ්චිත මුදල් ප්‍රමාණයක් රඳවාගත යුතු වුවත්, ආපන ශාලාවේ ඉදිකිරීමේ කොන්ත්‍රාතුව සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) 2011 අප්‍රේල් 18 දිනැති හා අංක PAYE/Tax/01/2011 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2 වන ඡේදය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව උපයන විට ගෙවීම් බදු අඩු කර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු කර නොතිබණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් පසු රු. 444,839 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපකව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.997,495 ක් විය. සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 12 කින් වැඩි වී තිබු නමුත් වියදම්වල සියයට 23 ක වැඩිවීම මෙයට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ක්‍රියාකාර සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම්වලට අදාල වැඩසටහන් 17 ක් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ). ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අංකගත කර එක් එක් අංශ සඳහා වෙනම ඉනවෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබුණි.

(ආ). සේවක භාරකාර අරමුදල සඳහා නියමිත දිනවලදී දායක මුදල් නොගෙවීම මත අවස්ථා දෙකකදී රු.4,668 ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ). ආයතනය මගින් දීප ව්‍යාප්තව පවත්වනු ලබන II හා III මට්ටමේ භාෂා ප්‍රවීණතා වර්ධන පාඨමාලා සඳහා සහභාගි වූවන්ගෙන් සියයට 80 පමණ පාඨමාලා අතරතුරදී ඉවත්ව ගොස් ඇති බවත්, සහභාගි වන නිළධාරීන් අඛණ්ඩව සහභාගී කරවා ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවීම නිසා රාජ්‍ය සේවකයන්ගේ භාෂා වර්ධනය සඳහා දරනු ලබන විශාල මුදල් ප්‍රමාණයෙන් අපේක්ෂිත අරමුණු ලගාකර ගැනීමට නොහැකි වී තිබු බවත් නිරීක්ෂණය විය. එමෙන්ම පවත්වනු ලබන භාෂා පන්ති වල සාර්ථකත්වය මැන බැලීම සඳහා ද විධිමත් ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

### 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩලයේ විධායක තනතුරු දෙකක් හා විධායක නොවන තනතුරු දෙකක් පුරප්පාඩුව පැවතුණු අතර විස්තර පහත දැක්වේ.

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | විධායක | 09 | 07 | 02 |
| (ආ) | විධායක නොවන | 09 | 07 | 02 |
| (ඇ) | අනෙකුත් | 07 | 07 | - |
| | එකතුව | 25 | 21 | 04 |

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### ක්‍රියාකාර සැලැස්ම

ආයතනය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාර සැලැස්ම තුල එක් එක් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒ ඒ අංශ වල කළමණාකරුවන්ගේ වගකීම දක්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ). වාහන උපයෝජනය

(ආ). කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ). පුස්තකාල පාලනය

(ඈ). වත්කම් කළමණාකරණය

(ඉ). ගිණුම්කරණය

(ඊ). මූල්‍ය පාලනය